# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1703/44 - 2011 අප්‍රේල් 29 වැනි සිකුරාදා - 2011.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට ආසියානු සංවර්ධන බැංකු ආධාර 6 ව්‍යාපෘතිය යටතේ යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන ක්‍රමයේ පොම්මෙයිවෙලි ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2011 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 34, නාරාහේන්පිට පාර, නාවල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/912.

### උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මූර්ස්ට්‍රීට් උතුර (J/87) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ , පොම්මෙයිවෙලි නාවන්තුරේයි උතුර ගමේ මාතෘ සායනය පිහිටි ඉඩම නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.06 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මහනගර සභාවේ පෙර පාසැල පිහිටි ඉඩම ; |
| *නැගෙනහිරට* | : | පුද්ගලික ඉඩම (හිමිකරු නොදනී) ; |
| *දකුණට* | : | පුද්ගලික ඉඩම (හිමිකරු නොදනී) ; |
| *බටහිරට* | : | මාතෘ සායනය පිහිටි ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. නගර සභාව,
යාපනය.

05-355


1A - G 14475 — 345 (2011/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.